GENDER JUSTICE & SECURITY
A GCRF HUB

# අධිකරණ වෛද්‍ය නිලධාරිවරයා



# හැඳින්වීම

- මෙම  මාර්ගෝපදේශ අදාළ වන්නේ

a) ස්ත්‍රී/පුරුෂ සමාජභාවය මත පදනම් වූ ලිංගික ප්‍රචණ්ඩත්වයේ වින්දිතයින් /ශේෂිතයන් (Victim-Survivors),

b) පැමිණිලි සටහන් තබන පොලිසිය,

c) වෛද්‍ය පරීක්ෂණ මෙහෙයවන අධිකරණ වෛද්‍ය නිලධාරීන්,

d) ශේෂිතයාට සහාය ලබාදෙන හිතෛෂීවන්තයා/ මානව හිමිකම් නීතිඥයා හෝ සංවිධානයටයි.

- මෙකී වෙනස් කණ්ඩායම් හතරේ ප්‍රයෝජනය උදෙසා මාර්ගෝපදේශ කොටස් හතරකට බෙදා ඇත. පැමිණිල්ලට අදාළව වෛද්‍ය සහ නීතිමය ක්‍රියාවලිය සඳහා ඉක්මන් යොමු කිරීමක් ඔවුන් වෙතින් ලබාගත හැකිය.

- ශ්‍රී ලංකාවේ ලිංගික හා ස්ත්‍රී/පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය (SGBV) ඉහළ අගයක් ගනී. 2020 දී පමණක් ව්‍යවස්ථාපිත ස්ත්‍රී දූෂණ (වයස අවුරුදු 16ට අඩු ගැහැනු ළමුන් දූෂණය කිරීම්) සිද්ධි 1391ක් සහ ස්ත්‍රී දූෂණ (වයස අවුරුදු 16ට වැඩි කාන්තාවන් දූෂණය කිරීම්) 257ක් පොලිසියට වාර්තා  වී ඇත.

- https://www.police.lk/wp-content/uploads/2023/07/GRAVE-CRIME-ABSTRACT-FOR-WHOLE-ISLAND-FROM-01.01.2022-TO-31.12.2022.pdf බලන්න:

GENDER JUSTICE & SECURITY
A GCRF HUB

2024 ජනවාරි 04 සිට මාර්තු 10 දක්වා ශ්‍රී ලංකා පොලිසියේ ළමා හා කාන්තා අපයෝජන වැළැක්වීමේ කාර්යාංශයේ ස්ථාපිත විශේෂ ඒකකයට '109' ක්ෂණික ඇමතුම් අංකය හරහා කාන්තාවන් හා ළමයින්ට එරෙහි අපයෝජන, ප්‍රචණ්ඩත්වය සහ විවිධ හිරිහැර කිරීම් සම්බන්ධ පැමිණිලි 1,077ක් ලැබී ඇත.

( https://www.adaderana.lk/news.php?nid=98185 )

ශ්‍රී ලංකාව තුළ සිදු කළ ලිංගික ප්‍රචණ්ඩත්වය පිළිබඳ පර්යේෂණ වලින් පෙනී යන්නේ ලිංගික හා ස්ත්‍රී/පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයට අදාළ සත්‍ය සිදුවීම් පොලිසියට වාර්තා වූ ප්‍රමාණයට වඩා වැඩි බවයි. මෙසේ පැමිණිලි නොකිරීමට බොහෝ හේතු ඇත.

ලිංගික හා ස්ත්‍රී - පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය පිළිබඳ කළ පර්යේෂණවල දී සහ ශේෂිතයන් සමඟ සාකච්ඡා කිරීමෙන් පසු, ශේෂිතයන් අනුගමනය කළ ප්‍රායෝගික ක්‍රියා පටිපාටිවල හිඩැස් සහ ඒ පිළිබඳ නිසි දැනුවත්භාවයක් නොමැතිකම ඉස්මතු වී පෙනුණි.

තමන්ට මුහුණ දීමට සිදු වූ ප්‍රහාරය හේතුවෙන් දැනටමත් කායික හා මානසික පීඩාවෙන් පෙළෙන ශේෂිතයන්ට මෙමඟින් තවත් දුෂ්කරතා රැසක් එකතු වී ඇත. එබැවින් වින්දිත/ශේෂිත පුද්ගලයාට පහසුවක් ඇති කිරීමට අධිකරණ වෛද්‍ය නිලධාරිවරයා (JMO) විසින් වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. තවද, අධිකරණ වෛද්‍ය නිලධාරිවරයා විසින් ඉදිරිපත් කරන ලද ලියකියවිලි විශේෂඥ සාක්ෂි වශයෙන් සලකන හෙයින් ඒ මත අධිකරණය රඳා පවතී. එබැවින් මෙහිදී ඔහු අතිශයින්ම වැදගත් නිලධාරියෙකි.




GENDER JUSTICE & SECURITY
A GCRF HUB

# අනිවාර්ය ක්‍රියාපටිපාටිය




- **ශ්‍රී ලංකාවේ නීතියට අනුව අධිකරණ වෛද්‍ය නිලධාරිවරයා විසින් අනුගමනය කළ යුතු අනිවාර්ය  ක්‍රියා පටිපාටියක් ඇත.**
- ලිංගික අපයෝජනයට ලක්වූ වින්දිත/ශේෂිත පුද්ගලයන්ගේ පරීක්ෂණ, වාර්තා කිරීම සහ කළමනාකරණය පිළිබඳ ජාතික මාර්ගෝපදේශ, වෛද්‍ය නීතිමය අරමුණු සඳහා අධිකරණ වෛද්‍ය පරීක්ෂණයක් පවත්වන ආකාරය පිළිබඳ පුළුල් දළ විශ්ලේෂණයක් JMO වෙත සපයයි.
- මෙම මාර්ගෝපදේශ අනෙකුත් ජාතික මාර්ගෝපදේශ, සමඟ ඒකාබද්ධව කියවා, වෛද්‍ය පරීක්ෂණය පැවැත්වීම සහ ලේඛනගත කිරීම සහ අධිකරණ වෛද්‍ය නිලධාරිවරයාගේ වගකීම් පිළිබඳ පරිශීලක හිතකාමී යෝජනා පියවරෙන් පියවර දක්වයි.
- **මෙහිදී නිරපේක්ෂ පෞද්ගලිකත්වයක් අනිවාර්යයෙන්ම තිබිය යුතුය.** (වින්දිත පුද්ගලයා/ශේෂිතයා විසින් තමන්ගේ කතාව පවසන විට එය ඇසෙන හෝ පෙනෙන දුරක කිසිවකු නොසිටිය යුතුය.)
- JMO විසින් විනිශ්චයෙන් තොරව ශේෂිතයාට සවන් දිය යුතු අතර, වෛද්‍ය සැකසුම් හෝ අධිකරණයේ වාර්තා කිරීමට අවශ්‍ය විට හැර සියලු තොරතුරුවල රහස්‍යභාවය සුරැකිය යුතුය.

# පොලිස් ක්‍රියා පටිපාටිය

- සාක්ෂි එකතු කිරීම සඳහා අපරාධය සිදු වූ ස්ථානයට වින්දිත/ශේෂිත පුද්ගලයකු රැගෙන යෑමේ බලයක් පොලිසිය සතුය.

- **ශේෂිතයා ලිංගික හිංසනයට ලක්ව ඇත්නම්** (ලිංගික ප්‍රචණ්ඩත්වය පිළිබඳ නිර්වචනය සඳහා http://www.commonlii.org/lk/legis/num_act/pca22o1995213/ බලන්න.) **සහ/හෝ ඝාතනය කර ඇත්නම්** හෝ පොලිසියට වරෙන්තුවක් නොමැතිව අත් අඩංගුවට ගත හැකි අපරාධයක් සිදු කර ඇත්නම් (සීසීපී උපලේඛන 1 බලන්න) එවිට පළමු තොරතුරු (FI ) ලැබුණු වහාම මහේස්ත්‍රාත්වරයාට දැනුම් දීමට පොලිසිය බැඳී සිටියි. එම තොරතුරු මූලස්ථාන පොලිස් පරීක්ෂණ වෙත ද යවනු ලැබේ.

- මහේස්ත්‍රාත්වරයා විසින් ස්ථාන/දර්ශන නැරඹීමෙන් පසුව වැඩිදුර පරීක්ෂණයක් පැවැත්වීමට පොලිසියට නියෝගයක් ලබා දෙනු ඇත.

- ශේෂිතයා (ජීවත්ව සිටී නම්) වෛද්‍ය පරීක්ෂණයක් සඳහා අධිකරණ වෛද්‍ය නිලධාරියා වෙත හෝ ශේෂිතයා මියගොස් ඇත්නම් සිරුර පශ්චාත් මරණ පරීක්ෂණය සඳහා යැවීමට උපදෙස් දෙනු ඇත.



# වෛද්‍ය පරීක්ෂණය






පොලිසිය විසින් ශෝෂිත පුද්ගලයා සහ අපරාධය කළ බව කියන පුද්ගලයා යන දෙදෙනාම, වෙන වෙනම රෝහලට රැගෙන ගොස් සාක්ෂි එකතු කිරීම සඳහා වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කළ යුතුය.

JMO විසින් අධිකරණ වෛද්‍ය පරීක්ෂණ පෝරමයේ (MLEF) කොටු අංක 09 සිට 22 දක්වා සම්පූර්ණ කළ යුතුය. එය JMO වෙත භාර දීමට පෙර පොලිසිය විසින් පෝරමයේ කොටු අංක 01 සිට 08 දක්වා පුරවා තිබිය යුතුය




GENDER JUSTICE & SECURITY
A GCRF HUB

# අධිකරණ වෛද්‍ය පරීක්ෂණ පෝරමය



ඇතැම්  අවස්ථාවලදී ලිංගික හිංසනයට ලක් වූ ශේෂිත පුද්ගලයකු කෙළින්ම රෝහලට පැමිණිය හැකිය. එවන් අවස්ථාවක ලිංගික හිංසනය පිළිබඳ තොරතුරු සොයාගැනීමෙන් පසුව, රෝහල්  ද් කාර්ය මණ්ඩලය විසින්ම ශේෂිත පුද්ගලයාව ඔබ වෙත යොමු කළ හැකිය.

එවැනි අවස්ථාවක ශේෂිත පුද්ගලයා සමඟ කතා කිරීමට, ලිංගික හිංසනය තහවුරු කරගැනීමට, එය රෝහල් පොලිසියට වාර්තා කිරීමට සහ අධිකරණ වෛද්‍ය පරීක්ෂණ පෝරමය (MLEF) ලබා ගැනීමට කටයුතු කරන්න.

ඇය/ඔහු පැමිණිල්ල පොලිසියට ඉදිරිපත් කිරීමෙන් පසුව ශේෂිත පුද්ගලයා රෝහලට ඇතුළත් කරනු ලැබුවහොත්, MLEF පෝරමයේ 01-08 දක්වා වගන්ති පොලිසිය විසින් පුරවා අත්සන් කර ඇති බවට සහතික කරගන්න.





බහුවිධ කළමනාකරණයක් මෙන්ම අදාළ සිද්ධි සම්මන්ත්‍රණයක්  (case conference)  පැවැත්වීම පහසු කිරීමට වයස අවුරුදු 16ට අඩු ශේෂිතයකු සම්බන්ධයෙන් ඇය/ඔහු රෝහලට ඇතුළු කිරීම වඩාත් යෝග්‍යය. *[1]*

*[1] ප්‍රනාන්දු, අස්විනී සහ ළමා රෝග විශේෂඥයන්, සාමාජිකයන් සහ කමිටු සාමාජිකයන්. (2014) ළමා අපචාර සහ නොසලකා හැරීම් කළමනාකරණය සඳහා ජාතික මාර්ගෝපදේශ  බහු ආංශික ප්‍රවේශය.*

# කැමැත්ත

- ශේෂිත පුද්ගලයාගේ කැමැත්ත ලබාගන්න. ශේෂිත පුද්ගලයාගේ කැමැත් අනිවාර්ය වේ. ශේෂිත පුද්ගලයා වෛද්‍ය පරීක්ෂණයට එකඟ නොවන්නේ නම්, වෛද්‍ය පරීක්ෂණයක් සඳහා මහේස්ත්‍රාත් නියෝගයක් ලබා ගැනීමට පොලිසියට හැකිය.
- ශේෂිතයා වයස අවුරුදු 16ට අඩු නම්, නඩුව වාතර්ා කරන මවුපියන්ගේ හෝ භාරකරුවන්ගේ කැමැත්ත ලබා ගැනීමට JMOට උපදෙස් දෙනු ඇත.
- මෙම නිලධාරීන් ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ (NCPA) හෝ පරිවාස නිලධාරීන් පමණක් විය යුතුය.
- ශේෂිත පුද්ගලයා වයස අවුරුදු 16ට වැඩි නම් සහ කැමැත්ත ලබා දීම ප්‍රතික්ෂේප කරන්නේ නම්, ශේෂිතයාගේ විශ්වාසය ගොඩනඟා ගැනීමටත් විශ්වාසය ගොඩනඟා ගැනීමේ අරමුණ සඳහාත් සංවිධානය වන්න.
- ශේෂිතයා අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටිය සහ වෛද්‍ය පරීක්ෂණයේ වැදගත්කම පැහැදිලි කරන්න. ශේෂිත පුද්ගලයා වයස අවුරුදු 16ට වැඩි නම් සහ කැමැත්ත ලබා නොදෙන්නේ නම්, ඇයට/ඔහුට වෛද්‍ය පරීක්ෂණයට මුහුණ දෙන ලෙස බල නොකිරීමට සැලකිලිමත් විය යුතුය.



අධිකරණ වෛද්‍ය පරීක්ෂණයට පෙනී නොසිටීමෙන් ගම්‍ය වන අදහස පැහැදිලි කළ යුතුය. ඔබ මූලික ඉතිහාසය වාර්තා කළ යුතුය. (වාචිකව ලබාගත හැකි ඕනෑම තොරතුරක්/ විස්තර ආදිය) ශේෂිත පුද්ගලයා විසින් වෛද්‍ය පරීක්ෂණය සිදු කිරීමට කැමැත්ත දී නොමැති බව වාර්තා කර ඔහුගේ/ඇයගේ අත්සන ලබාගන්න. (ශ්‍රී ලංකාවේ අධිකරණ වෛද්‍ය විද්‍යාඥයන්ගේ විද්‍යාලය විසින් හඳුන්වා දෙන ලද වෛද්‍ය නීතිමය අරමුණු සඳහා ලිංගික අපයෝජනයට ලක් වී ශේෂිත පුද්ගලයන්ගේ පරීක්ෂණ, වාර්තා කිරීම සහ කළමනාකරණය සඳහා වන ජාතික මාර්ගෝපදේශය (2014) බලන්න.)

සංජානන දුවර්ලතා හේතුවෙන් ශේෂිත පුද්ගලයාට නීත්‍යානුකූලව කැමැත්ත ප්‍රකාශ කිරීමට නොහැකි වූ විට, වෛද්‍ය පරීක්ෂණය සඳහා භාරකරුගෙන් අවසර ලබා ගත යුතුය. සංජානන දුවර්ලතාව බරපතළ නම් මහේස්ත්‍රාත් නියෝගයක් ලබා ගත යුතුය.




සංජානන ආබාධිත ශේෂිතයකුගෙන් මනෝවිද්‍යාත්මක තක්සේරුවක් ලබා ගැනීම හොඳ භාවිතයකි. (සංජානන වයස ආදිය තක්සේරු කිරීමට) JMO ට එසේ කිරීමට බල කෙරෙන නියෝගයක් නොමැති වුව ද එය නිර්දේශ කෙරේ. මෙය නිත්‍ය පිළිවෙතක් ලෙස කළ යුතුය.


ශේෂිතයා ඔසප් දින ගෙවන්නේ නම්, සවිස්තරාත්මක පරීක්ෂණයක් සඳහා නැවත දිනෙක පැමිණෙන ලෙස ඇයට උපදෙස් දිය යුතුය.

ඔසප් වීම නතර වූ පසුව සාමාන්‍ය පරීක්ෂණය සම්පූර්ණ කර සායනික පරීක්ෂණය සඳහා නියමිත වේලාවක් සහ දිනයක් සඳහන් රිසිට් පතක් ශේෂිත පුද්ගලයාට ලබා දෙන්න.

GENDER JUSTICE & SECURITY A GCRF HUB

**ශෝෂිත පුද්ගලයාට රිසිට් පතක් ලබා දෙන්න.** එහි පරීක්ෂණය පැවැත්වූ JMO/DMOගේ නම සහ තනතුර සහ පරීක්ෂණය පැවැත්වූ දිනය සහ ස්ථානය ඇතුළත් කරන්න.

**පරීක්ෂණයෙන් පසුව ශෝෂිත පුද්ගලයාව සෑම විටම රෝහලක මානසික උපදේශකයකු/රෝහලක මානසික සෞඛ්‍ය ඒකකයක්, නාරිවේද වෛද්‍යවරයකු වෙත යොමු කළ යුතුය.** (ප්‍රජනක සෞඛ්‍ය, තුවාල, ඖෂධ/ප්‍රතිකාර සඳහා) සහ ලිංගාශ්‍රිත බෝවන රෝග විශේෂඥ වෛද්‍යවරයකු (STDs) හෝ උපදේශකයකු වෙත යොමු කළ යුතුය.



මහේස්ත්‍රාත්වරයා විසින් ලේඛන පරීක්ෂා කර සැකකරුගේ ඇප අයදුම්පත් සලකා බැලීමට හෝ වැඩිදුර විමර්ශනය සඳහා නියෝග ලබා දීමට අධිකරණ වෛද්‍ය වාර්තාව (MLR ) ඉල්ලා සිටියි.

ඉන් පසුව ඔබ විසින් සෘජුවම අධිකරණ වෛද්‍ය වාර්තාව (MLR) අධිකරණ රෙජිස්ටාර් වෙත ඉදිරිපත් කළ යුතුය.

අධිකරණ වෛද්‍ය නිලධාරීන් වැනි වෛද්‍ය වෘත්තිකයන් අධිකරණයේ විශේෂඥ සාක්ෂි ලබා දෙන විට අනුගමනය කළ යුතු හොඳම පිළිවෙත් සඳහා වන මාර්ගෝපදේශයන්ට පහත සබැඳි ඔස්සේ පිවිසිය හැකිය.

https://www.avant.org.au/Resources/Public/20150825-giving-evidence-in-court/

https://www.gmc-uk.org/ethical-guidance/ethical-guidance-for-doctors/protecting-children-and-young-people/doctors-giving-evidence-in-court

https://www.mdanational.com.au/-/media/files/mdan-corp/publications/writing-medico-legal-reports--giving-evidence-in-court.pdf

http://www.humanrights.asia/resources/journals-magazines/eia/vol-4-no-2-april-2010/http-www-humanrights-asia-resources-journals-magazines-eia-eiav4n2-sri-lankas-judicial-medical-officers-their-concerns-and-the-torture-shortcut/

# කණ්ඩායම

- **මහාචාර්ය නෙලූෆර් ද මෙල්**
  *(සම අධ්‍යක්ෂ ස්ත්‍රී/පුරුෂ සමාජභාවය සහ ආරක්ෂක මධ්‍යස්ථානය සහ ඉංග්‍රීසි දෙපාර්තමේන්තුව , කොළඹ විශ්වවිද්‍යාලය)*

- **ආචාර්ය ජීන් පෙරේරා**

  *( ජ්‍යෙෂ්ඨ උපදේශක, ව්‍යාධිවේදය සහ අධිකරණ වෛද්‍ය දෙපාර්තමේන්තුව , වෛද්‍ය පීඨය, මොරටුව විශ්වවිද්‍යාලය.*

  *අධිකරණ වෛද්‍ය හා විෂ විද්‍යා අංශයේ විශ්‍රාමික (සභාපති)* මහාචාර්ය, *කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව)*

- **රනිතා ඥානරාජා**

  *(නීතිඥ)*

- **සඳනි යාපා අබේවර්ධන**

  *(නීතිඥ)*

- **හැරී ප්‍රනාන්දු**

  *(කාන්තාව සහ මාධ්‍ය සාමූහිකය)*

- **රුවංගි අමරසිංහ**

  *(ෆෝල්ඩ් මාධ්‍ය සාමූහිකය)*